

# පන්හිඳයි පින්සලයි



සිසිර දිසානායක

අභිමානයයි !

ලැබුවා වූ 2011 අළුත් අවුරුද්දක්, අළුත් දශකයක් සෑම සියළු දෙයින්ම සම්පූර්ණ, සිතුම් පැතුම් සර්වප්‍රකාරයෙන් ඉෂ්ඨ වෙන අවුරුද්දක් වේවා ! කියලා හැමෝටම ප්‍රර්ථනා කරනවා. ඒ වගේ ම මව්බිමේ ඉන්න අපේ නෑ හිතවතුන්ටත් කිරියෙන් පැණියෙන් ඉතිරෙන අළුත් අවුරුද්දක්, අළුත් දශකයක් වේවා ! කියලාත් ප්‍රාර්ථනා කරනවා.

ලංකාවේ ඉන්න අපේ උදවිය ගැන කියනකොට මට මතක් වෙන්නේ පහු ගියදා මෙහෙ ඇවිත් ගිය අපි කාගේත් "නෑ " මිතුරු" කට්ටිය ගැන...." පන්හිඳ බල බලා හිටිය ඉරිදා " දිවයින" පත්තරේ කනප්පුව උඩින් තිව්වා.

"අපි කාගේත් නෑ " මිතුරු කට්ටිය කිව්වේ ?" පින්සල ශ්‍රී ලංකාවේ ප්‍රවෘත්ති වෙබ් අඩවියකින් බල බලායි උන්නේ.

"අපේ ක්‍රිකට් කණ්ඩායම තමයි ඉතින්" පන්හිඳ ආයෙත් පත්තරේ ක්‍රීඩා පිටුව හොයන්න ගත්තා...

"පැන් උනන්දු වුණේ නැත්තං අපිට මේ පාරත් මැච් එක බලන්න යන්න බැරි වෙනවා." පින්සල කිව්වේ "ශ්‍රී ලංකා මෝරනිං ෂෝ" රූපවාහිනී වැඩ සටහන බල බලා උන්නු පැන්සලට ඇහෙන්න " නෑහෙන්න ගානට. ඇත්තටම ක්‍රිකට් ගැන පන්ටවත්, පින්ටවත් වැඩි උනන්දුවක් තිබුණේ නෑ. ඒත් පැන් හොඳ ක්‍රිකට් ලෝලියා. ලංකාවේ ඉන්න කාලෙත් තමන් රස්සාව කරපු ආයතනයේ කණ්ඩායමට සෙල්ලං කළා. එංගලන්තයේ ඉන්න දවස්වල සෙල්ලං නොකළත් නොබලපු ක්‍රිකට් තරගයක් නැති තරං.

"ටී. වී. එකේ මැච් බැලුවට මටනං කිසි ගතියක් නෑ. කැමරා කාරයා පෙන්නන ටික විතරනේ පේන්නේ. හිතේ හැටියට ඕන ඕන තැන් දිහා බලන්න තියෙන්න ඕනෙ" පැන්සලත් කතාවට හවුල් වුණා.

"ඒ වුණාට ළං කරලා පෙන්නන දේවල්, ආයෙ ආයෙ පෙන්නන වැදගත් දේවල් එහෙම බලන්න බෑනේ පිට්ටනියෙදි" පින් හරස් කැපුවා.

"ඇයි බැරි ? ෆැවිලියන් එකේ ටී. වී. ස්ක්‍රීන්ස් තියෙන්නේ ?"

එැන්ට තවම සිංහල වචන ගලා එනවා මදි. එංගලාන්තයේ නේ උන්නේ. ඕක හරියාවි. හැබැයි කරුණාරත්න අබේසේකර, ප්‍රේමසර ඈපාසිංහ, පාලිත පෙරේරා වගේ අපේ ක්‍රිකට් ක්‍රීඩා විස්තර කරන මහත්තැන්ලා එංගලාන්තයේ උපන් ක්‍රිකට් ක්‍රීඩාවේ එන ඉංගිරිසි වචන වලට සිංහල වචන තමන් ම හදාගත්තා. "කඩුල්ල", " ඉණිම", තණ තිල්ල "පන්දු වාර", "දැවී යනවා", "උඩ පන්දුව" වාගේ වචන ඒ විදියට අපේ ක්‍රීඩා ලෝලින් අතරට එක්වුණා.

"වචන පමණක්ම නොවේ. ක්‍රීඩා ශෛලියට පවා අපේ දේ එක් කිරීමට අපේ ක්‍රීඩකයෝ සමත් වූහ." පන්හිඳ ලියන මේසයට පැන්ගේ ලියන්න නිමිත්තක් අහුවුණ හන්දා.

එක් දින තරගාවලිවලදී ආරම්භක පිතිකරුවන් ලෙසින් පිටියට වැද මුල් පන්දුවාරවලදී හයේ පහර, හතර, හතරේ පහර එල්ලකරමින් සනත් ජයසූරියලා ක්‍රිකට් ක්‍රීඩාවට හඳුන්වා දුන්නේ නව සංස්කෘතියක් නොවේ ද ? " දුස්රා" නමින් තමන්ගේම ක්‍රමවේදයකට අනුව පන්දු යවමින් ගිනස් වාර්තා පොතට ඇතුලත් වූ මුත්තයියා මුරලිදරන් ලොව දක්‍ෂතම දඟර පන්දු යවන්නා වීය. ලසිත් මාලිංගගේ පන්දු යැවීමේ ඉරියව්ව අන් අයෙකුගෙන් දැකිය හැකි ද? ලෝක කුසලානය තෙක් ගිය ගමනේ දී ශ්‍රී ලාකේය



ක්‍රිකට් ක්‍රීඩකයෝ සිංහල කම පිටියේ දී සිය අවියක් කොට ගත්හ. එදිරිවාදී පිළට නොවැටහෙන සේ කණ්ඩායමේ සාමාජිකයින් අතර සිය අදහස් සංනිවේදනය කර ගන්නට සිංහල බස උපයෝගී කර ගත්හ. ශ්‍රී ලංකා ධජාරූඪව සිටිනා සිංහලයාගේ කග පතයි සිංහල කම. පසුගියදා මෙල්බර්න් හි ක්‍රිකට් ක්‍රීඩාංගනයේ පැවති තරගය පුරාවට ගිගුම් දුන්නේ සිංහලය යි. ක්‍රීඩාගාරයේදී ඔල්වරසන් දුන්නේ ශ්‍රී ලාංකේය හඬයි. ලෙල දුන්නේ හෙළ ධජ පතාකයි.

ශ්‍රී ලංකා නාමය ජාත්‍යන්තර කරළියට ගෙනයාමට උරදුන් එක් ප්‍රවාහයකි ක්‍රිකට් ක්‍රීඩාව. එහෙත් එය ක්‍රිකට් ක්‍රීඩා කරන රටවලට පමණක් සීමා වූවක් සේ හැඟෙයි.

තස්මේනියාවටත් වඩා කුඩා දිවයිනක් වූ ශ්‍රී ලංකා නාමය ලෝ පුරා ගෙන ගියා වූ අනෙක් ප්‍රවාහකයන් වන්නේ, අධිරාජ්‍යවාදී පාලන සමයේ දී පටන් ලොව පතල තේ ඇතුළු වෙනත් කුළු බඩු වර්ග, මැද පෙරදිගට සැපයෙන ශ්‍රම ශක්තිය, විවිධ දේශපාලන භූමිකාවන් යනාදී දේයි. පසුගිය දශක තුනක් තිස්සේ මව් බිම අඳුරින් වෙලූ ත්‍රස්තවාදය ද එක් හේතුවක් වූ බව ද කණගාටුවෙන් වුව සඳහන් කළ යුතුයි.

මේ වන විට ලොව පුරා විසිර සිටින ශ්‍රී ලාංකේය සම්භවයක් ඇති පිරිසගේ ඥාණ හා ශ්‍රම දායකත්වය විශේෂයෙන් සිහිපත් කළ යුතුයි. තමන්ට පැවරෙන දේ නිසියාකාරව වගකීමෙන් යුතුව ඉටු කරනා එවන් ලක් දූ පුතුන් මව් බිමට එක් කරන්නේ අභිමානයක්. අන් රටවලින් විදේශගතව ඥාණ හා ශ්‍රම දායකත්වය දෙන්නන් අභිබවමින් ඉදිරියට යන්නට ඔවුන් සමත් වන්නේ සිය ආගමික, සංස්කෘතික හා අධ්‍යාපනික පසුබිම විසින් දායක කළා වූ විනය ගරුක බව සත්‍යවාදී බව, උත්සහවන්ත බව, කැපවීම, සත්කාරය, කණ්ඩායම් හැඟීම වැනි යහගුණ නිසාවෙනි.

කුමන ආගමක් ඇදහුව ද මනුෂ්‍යයාගේ සදාචාරය රකින්නට එය ඉවහල් වෙයි. ඒ පසුබිමින් ම නිර්මාණය වන සංස්කෘතිය වඩ වඩාත් මිනිසා හික්මවයි. නිර්මාණාත්මකව සිතන්නට, යමක් කරන්නට අවැසි සම්පත් සපයයි. ක්‍රමවත් ව ලැබූ නිදහස් අධ්‍යාපනික පසුබිම කුමන රැකියාවකට වුවද සවිය සපයන ප්‍රධාන ශක්ති ජනකයයි. මේ දේ අප ලැබූයේ කොහෙන්ද, කෙළෙසින්ද යන්න නිරන්තරයෙන් අප සිහියේ රැඳිය යුතු නොවේද ?

මව් බිමෙන් අප ලැබූ දේ නිර්මාණය කර දුන්නේ අතීතයේ සිට අද දක්වා සුභවාදි සිතින් රට නැගූ පාලකයන්, විරුවන්, පඬුවන්, කලා කරුවන්, නිමැවුම් කරුවන් විසිනි. ඔවුන් උපන් ශ්‍රී ලංකා මව් කුසින් ඉපදීමට ලැබීමේ, මානය, අභිමානය, ජාතිකාභිමානය අප වෙත නිසැකයෙන්ම ඇත්තේය. එය අන්‍යන් පෙළනා අධිමානයක් නොවන්නේනම්, අපේ කම සැඟවීමට පොළඹවන හීනමානයක් නොවන්නේ නම් ඒ අභිමානය ද අප සතු වන්නේම ය."

පන් අලුත් අවුරුද්දේ හිතට ආව දේ ලියවිල්ලට එකතු කළා. මෙල්බර්න් ක්‍රිකට් ක්‍රීඩාංගනයේ ඉඳන් ආපහු ගෙදර එනකොට කෝච්චියේ දී පන්ට පද පෙලක් ලියවුණා. බ්‍රිස්බේන් නුවර ඉන්න උපමාලිකා කරුණාසේන හිතවතිය එයාගේ කුළුඳුල් ගීත එකතුව වෙනුවෙන් මේ සින්දුව එක් කරගන්නයි කල්පනාව. තනුවයි සංගීතයයි නිර්මාණය කරලා තියෙන්නේ ලංකාවේ ඉන්න මහින්ද බණ්ඩාර ප්‍රවීණ ගිටාර් වාදන ශිල්පියායි. ගීත එකතුව ජනවාරි 8 දා කොළඹදී එළිදක්වන්නයි සූදානම.

පින් අපේ අභිමානය රකින කලා නිර්මාණයක් පන්ගේ ලියවිල්ලට එක් කළා.

අභිමානයයි - මේ නැගෙන්නේ
සිදූ රළ පුරා - නුබ කුස පුරා
මිහි තල පුරා - සිහ ධජ අරා

මානයයි - අභිමානයයි - ජාතිකාභිමානයයි
මේ නැගෙන්නේ.....

දාසෙන් කසුබු නිරිඳුන් සැදූ
පැරකුම් ගැමුණු විරුවන් වැඩූ
තුන් ලෝ පසිඳු පඬවන් වැදූ
හෙළ මව් කුසින් ජන්මය ලැබූ

මානයයි - අභිමානයයි - ජාතිකාභිමානයයි
මේ නැගෙන්නේ.....

සීගිරි කුලෙන් සිතුවම් මැවූ
සන්දේශ කව් ජන ගී ගෙතූ
සක් බෙර වයා වන්නම් ගැයූ
හෙළ මව් ලෙයින් පන්නර ලැබූ

මානයයි - අභිමානයයි - ජාතිකාභිමානයයි
මේ නැගෙන්නේ.....

අතිල් ගුණසේකර මෙහෙයවන
VINSARA අධ්‍යාපන ආයතනයේ
Specialist Maths
Maths Methods
Further Mathematics
Physics
English
Literature
Chemistry
Accounting
යන විෂයයන් සඳහා 2011 VCE විභාගය වෙනුවෙන් උපකාරක පන්ති
2010 නොවැම්බර් මාසයේදී ආරම්භවේ.
ඒ සඳහා සිසුන් බඳවා ගැනීම දැන් සිදුකෙරේ.
තවද
ඉහත විෂයයන් සඳහාම 11 වසර වෙනුවෙන්ද
6 වසරේ සිට 10 වසර දක්වා
Maths
English
Science
යන විෂයයන් සඳහාද සිසුන් බඳවා ගැනීම දැන් සිදුකෙරේ.

VINSARA Institute of Education
"Helping you to achieve your best"
4, Station Road
Rosanna , VIC 3084
Tel: 0433 11 3836, 9456 9552, Fax: 9456 9553
( ABN: 36 898 149 733 )
www.vinsara.com.au

ADVERTISING
සන්නස
03 8707 4604
0402 025 516

Mathematics/ Science.
Year 7 -10
$20 per hour.
Current Uni Student
in Maths and Science.
Tel: 0433 737 584
or 9701 3241